# ඉතිහාසය ඉතිහාසයට සාපේක්ෂවීම

මහාවංශයෙහි වැරදි නැතිවා නො වෙයි. ඇතැම්විට රජවරුන්ගේ රාජ්‍ය කාලය සම්බන්ධයෙන් වැරදි තිබිය හැකි ය. මහාවංශය ලියා ඇත්තේ ජනප්‍රවාද හා කලින් ලියැවුණු වෙනත් කෘති අනුගමනය කරමිනි. පස්වැනි සියවස පමණ වන විට එක් පැත්තකින් දක්ෂිණ භාරතීය ආක්‍රමණ වැඩි වෙමින් තිබුණි. අනෙක් පැත්තෙන් මහායාන අදහස් තුන්වැනි හතරවැනි සියවස් වන විට ලංකාවේ අඩුම තරමින් අභයගිරිය වෙළාගෙන තිබුණි. එයින් අදහස්කරන්නේ අභයගිරිය මහායානික මධ්‍යස්ථානයක් වූ බව නො වෙයි. එහෙත් නාගර්ජුනපාදයන් වහන්සේගේ කාලයේ සිට ම ලංකවේ මහායාන අදහස් පැවති බවට සාක්ෂි වෙයි. ලංකාවේ මහායාන ව්‍යාප්තිය හතරවැනි සියවස වන විට වැඩි වී ඇත.

නාගර්ජුනපාදයන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය වහන්සේ වූයේ ලංකාවෙන් භාරතයට වැඩම කළ ආර්යදේව ස්වාමින් වහන්සේ ය. උන්වහන්සේ පැවිදිවීමට පෙර කුමාරයකු ව සිටියේ යැයි කියැවෙයි. ඉන් කියැවෙන්නේ නාගර්ජුනපාදයන් වහන්සේගේ කාලයේ සිට ම රජ පවුලට ද මහායාන අදහස් ව්‍යාප්ත වී තිබුණු බව ය. ඇතැම් විද්වතුන්ට අනුව නාගර්ජුනපාදයන් වහන්සේ මහායාන භික්ෂුන් වහන්සේ නමක නොව ථෙරවාදය ම ඉදිරියට ගෙනගිය බුද්ධ පුත්‍රයාණන් වහන්සේ නමකි.

අපි මේ මතය ප්‍රතික්ෂේප කරමු. ශූන්‍යතාවාදය ථෙරවාදයට අයත්වූවක් නො වෙයි. ශූන්‍ය යන්න අනිත්‍ය දුක්ඛ අනාත්ම සමග එකට කියැවෙන බුදු වදනකි. එහෙත් ශූන්‍යතාව යන්න නාමපදයක් ලෙස ගත්කල ථෙරවාදයට අයත්වන්නක් නො වෙයි. නාම පදයක් ලෙස ඉන් ආත්මවාදයක් ජනනය කරයි. අනිත්‍යතාව යන්න ද එලෙස ආත්මවාදයක් ජනනය කරන පදයකි. ශූන්‍යතාව පසු කලෙක සංකරාචාර්යවරයනට අද්වෛත වේදාන්තයෙහි නිර්ගුණ් බ්‍රහ්මන් යන සංකල්පය නිර්මාණයකිරීමට පසුබිම සකස්කෙළේ ය.

ඒ කෙසේ වෙතත් මහායාන අදහස් පැතිරගිය කලෙක, දක්ෂිණ භාරතීය ආක්‍රමණ වැඩි වූ කලෙක ජනප්‍රවාදවලට හා උගතුන් අතර ඇතිවුණු සාකච්ඡාවලට එයට විරුද්ධ මතවාද එකතු විණි නම් ඒ පුදුමයක් නො වෙයි. එවැනි යුගයක ලියැවුණු මහාවංශය ථෙරවාදය ආරක්ෂාකිරීම සඳහා පෙනී සිටීම අපේක්ෂා කළයුතු ය. අප කලින් සඳහන්කර ඇති පරිදි ආන්ද්‍ර ප්‍රදේශයෙහි ථෙරවාදය නැති වී යෑමේ තර්ජනයට මුහුණ දුන් මෙකල ලංකාවේ ථෙරවාදය ආරක්ෂාකිරීම සිංහලයන්ගේ වැදගත් ම කාර්‍යභාරය බවට පත්වන්නටඇතැයි සිතිය හැකි ය.

ගැමුණු රජු දවස ඇති වූ සිංහල බෞද්ධ රාජ්‍යයට අවශ්‍ය ප්‍රවාද සැපයුනේ මෙකල යැයි සිතිය හැකි ය. ඒ ප්‍රවාද හුදෙක් මහානාම හිමියන්ගේ තිතළු නොව ජනතාවගේ හා බුද්ධිමතුන්ගේ සාමුහික උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස සිතිය හැකි ය. ථෙරවාදය හෙවත් පැරණි බුදුදහම ආරක්ෂාකිරීම සිංහලයන්ගේ කාර්යභාරය වීමෙන් පසුව ඒ තව තවත් ජනතාව අතර තහවුරුකිරීම සඳහා සිංහල ජාතියේ ආරම්භය බුදුන්වහන්සේගේ පරිනිර්වාණය සමග සම්බන්ධකිරීමට කිසිවකුට අවශ්‍ය වී නම් ඒ පුදුමයක් නො වෙයි.

එවිට සිංහල ජාතියේ ආරම්භය පණ්ඩුකාභය රජුගෙන් ඈතට ගෙන යෑමට අවශ්‍යතාවක් පැනනගියි. මෙකල වන විට සමාජයේ තවත් වැදගත් කාර්යයක් ද සිදු වී අවසන් බව පෙනී යයි. පණ්ඩුකාභය රජු දවස සිංහල ජාතිය ආරම්භ වී ඇත්තේ දඹදිවින් පැමිණි අර්ධ වෛදිකයන් හා මෙරට වාසයකළ විවිධ ගෝත්‍රිකයන් එක් වී බව පැහැදිළි ය. පණ්ඩුකාභය පුවතින් හෙළිවන්නේ එහි දී යම් ආකාරයකට ගෝත්‍රික බලය, විශේෂයෙන් ම යක්ෂ ගෝත්‍රිකයන්ගේ බලය තහවුරු වූ බව ය. එහෙත් මාගම රජවරුන් බලවත්වීමත් සමග නැවතත් අර්ධ වෛදිකයන්ගේ තහවුරුවීමක් අපට දැකගත හැකි ය. ඇතැම්විට එයට හේතුවක් වන්නට ඇත්තේ යක්ෂ ගෝත්‍රිකයන් බුදුදහම පිළිගැනීමට දැක්වූ අකමැත්ත විය හැකි ය.

මේ කරුන තවත් අධ්‍යයනය කළයුතු ය. ඇතැමුනට අනුව යක්ෂයන්ගේ සම්භවය ඇත්තේ අද ඉරානය නමින් හැඳින්වෙන පර්සියාවෙහි ය. පර්සියාවෙන් සංක්‍රමණය වූ යක්ෂයන් දඹදිව මෙන් ම ලංකාවේ ද පදිංචිවන්නට ඇත. මොවුහු පාරම්පරිකව දඹදිව වැසියෝ නො වූහ. ඔවුන්ගේ සංස්කෘතිය දඹදිව අනාර්ය සංස්කෘතිය නො වී ය. වෙනත්

© Prof. Nalin De Silva

වචනවලින් කිවහොත් ඔවුහු අර්ධ වෛදික සම්ප්‍රදායට අයත් නො වූහ. සිදුහත් කුමරු මෙන් ම ලංකාවට දඹදිවින් පැමිණියෝ ද අර්ධ වෛදිකයෝ වූහ. එමෙන් ම නාග දේව ආදී ගෝත්‍ර අනාර්ය (ද්‍රවිඩ නොවන අරුතකින්) ලෙස සැලකිය හැකි ය.

යක්‍ෂයන් අර්ධ වෛදික නොවීමේ ප්‍රතිඵලය වූයේ අර්ධ වෛදික සංස්කෘතියක උපත ලත් බුදුදහම ඔවුන්ට එතරම් රුචි නො වීම ය. දඹදිව ද යක්‍ෂ ගෝත්‍රිකයෝ බුදුදහමෙහි ව්‍යාප්තියට බාධා පැමිණවූහ. බමුණන් හැරුණු කොට බුදුන් වහන්සේ සමග වාදවලට එළඹී ඇත්තේත් බුදුන්වහන්සේට මුල දී අවනත වී නැත්තේත් යක්‍ෂයන් බව පැහැදිළි ය. ලංකාවේ යක්‍ෂයෝ ද බුදුදහමට විරුද්ධ ආකල්පයක් දැරූහ. නාග දේව ආදී ගෝත්‍රවලින් එවැනි විරුද්ධත්වයක් නොමැති වුව ද (ඔවුහු ඉතා කැමැත්තෙන් බුදුදහම වැළඳගත්හ.) ඇතැම් යක්‍ෂයෝ බුදුදහමේ ව්‍යාප්තියට විරුද්ධවූහ.

මුලින් එලෙස විරුද්ධ වූ සංඛ්‍යාව විශාල වන්නට ඇතැයි සිතිය හැකි ය. බුදුන් වහන්සේ ලංකාවට වැඩම කර මහියංගනයේ දී යක්‍ෂයන් දමනයකිරීම පිළිබඳ පුවතක් ජනප්‍රවාදයට එකතුවී ඇත්තේ එලෙසින් ය. කලින් ද සඳහන්කර ඇති පරිදි දේවානම්පිය තිස්ස රජු යක්‍ෂයකු තමන්ට කතාකරන්නේ දැයි සිතමින් බියවිය. රජුට නමින් කතාකළ යක්‍ෂයෝ එකල සිටිය හ. මෑතක් වන තුරුම මින්නේරියේ සාමාන්‍ය සිංහලයන්ට වඩා වෙනස් ආකාරයකට බුදුදහම පිළිගත් ජනයා විසූහ.

ඇතැම් සිංහලයන් එළාර රජුට පක්‍ෂපාතී වූ බව සඳහන් වෙයි. ඔහුගේ හමුදාවේ සේවයකළ සිංහලයෝ ද වූහ. මෑතක දී ඇතැම් සිංහලයන් පෘතුගීසින්ට ලන්දේසින්ට හා බ්‍රිතානින්ට සේවයකළ අයුරින් එකල ද ඇතැම් සිංහලයන් එළාර රජුට සේවයකරන්නට ඇත. එහෙත් අප මෙහි දී සැලකිල්ලර ගතයුතු තවත් කරුණක් වෙයි. එළාර රජු පර්සියාවෙන් පැමිණි අයකු නම් ඔහු යක්‍ෂයකු වීමට ඉඩක් වෙයි. එකල මෙහි සිටි සිංහලයන් වූ යක්‍ෂයෝ ඔහුට සේවයකළෝ ද? අපට මේ කරුණු සම්බන්ධයෙන් ස්ථිර නිගමනයකට පැමිණීමට නො හැකි ය. එහෙත් මේ කරුණු පිළිබඳ අප නැවතත් සිතා බැලිය යුතුවෙයි.

බුදුදහම ලංකාවේ ව්‍යාප්තවත් ම යක්‍ෂයන්ට රටේ තිබූ පිළිගැනීම ද අඩුවන්නට ඇත. ඒ සමග නැවතත් අර්ධ වෛදිකයන්ගේ බලය වැඩිවන්නට ඇත. එහි එක් ප්‍රතිඵලයක් වූයේ සිංහල ජාතියෙහි සම්භවය පිළිබඳ වෙනත් ම ප්‍රවාදයක් ඇතිවීම ය. සිංහලයන් දඹදිවින් පැමිණි අර්ධ වෛදිකයන්ගෙන් (එනමින් ඔවුන් හඳුන්වා නොතිබීම ප්‍රශ්නයක් නො වේ.) පැවත එන්නන් ය යන මතය සමාජයෙහි තහවුරුවන්නට ඇත්තේ එපරිදි යැයි සිතිය හැකි ය..

එපමණක් නො වේ. ගැමුණු රජුගේ මාගම රජ පරපුර අනුරාධපුර රජ පරපුර සමග සම්බන්ධ බවට ද මතයක් ඇති වී තිබේ. එහි ප්‍රථිඵලය වී ඇත්තේ මාගමට රජවරුන් අනුරාධපුරයෙන් ගිය බවට ප්‍රවාද හෝ ජනප්‍රවාද හෝ ඇතිවීම ය. දේවානම්පිය තිස්ස රජු සහ ගැමුණු රජු අතර ඥාති සම්බන්ධයක් ඇතිවීම එහි ප්‍රතිඵලයක් විය. ඉතිහාසයට එක් වී ඇති මෙවැනි ජනප්‍රවාද හේතුවෙන් මහාවංශයේ මුල් පරිච්ඡේද තරමක් අසංගත වෙයි.

පණ්ඩුකාභය රජුගෙන් ඈතට සිංහල ජාතියේ සම්භවය ගෙන යෑම, සිංහලයන්ගේ ප්‍රධාන කාර්යය බුදුදහම ආරක්‍ෂාකිරීම බවට පත්වීම ජනතාවට තවත් ඒත්තුගැන්වීම සඳහා සිංහල ජාතියේ සම්භවය බුදුන් වහන්සේගේ පරිනිර්වාණයත් සමග සම්බන්ධකිරීම ආදියෙහි ප්‍රතිඵලය වී ඇත්තේ අර්ධ වෛදිකයන් මෙරටට පැමිණීම සියවස් හතරකින් පහකින් පමණ පමාකර බුදුන් වහන්සේ පිරිනිවන්පෑ දිනයෙහි දී විජය කුමරුට බැරකිරීම ය ; ඒ හේතුවෙන් බුදුන් වහන්සේගේ පිරිනිවන්පෑමෙහි සිට ගැමුණු රජතුමා දක්වා වූ කාලයෙහි මහාවංශ හා ජනප්‍රවාද කතාව එතරම් සංගත නො වීම ය.

පණ්ඩුකාභය රජතුමාගේ රාජ්‍ය කාලය අවුරුදු හැත්තෑවක් පමණ වන්නේත් විජය රජු සිට ගැමුණු රජු දවස දක්වා රජවරුන්ගේ රාජ්‍ය කාල හරිහැටි එකතු නොවන්නේත් මේ ඉතිහාස කතාව සංගත නොවන බැවිනි. එහෙත් ඒ කතාවෙහි ඇති හරය කුමක් දැයි වටහාගැනීමට අප සමත් වියයුතු ය. එසේ නැතිව මහාවංශය බොරු යැයි කීමට හෝ ගැමුණු රජුගේ රාජ්‍ය කාලය බුදුන් වහන්සේගේ සමයට යැවීමට හෝ අප ඉක්මන් නොවිය යුතු ය. මහාවංශයෙහි

© Prof. Nalin De Silva

ඒ ඈත කාලයෙහි අසංගත බවක් තිබුණ ද බොහෝ කරුණු සෙල්ලිපි හා ඓතිහාසික සාධක සමග සංගත වන බව අමතක නොකළ යුතු ය.

කිසිම ඉතිහාසයක් මුළුමනින් ම සියළු සාධක සමග සංගත වන්නේ යැයි නො සිතමි. භෞතික විද්‍යාවේ ප්‍රවාද ද සියළු කරුණු සමග සංගත නො වෙයි. නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණය ග්‍රහවස්තුවල චලිතය සමග මුළුමනින් ම සංගත නො වෙයි. නිව්ටෝනීය භෞතික විද්‍යාවේ කුමක් කියැවුණ ද ග්‍රහවස්තු සූර්යයා වටේ අචල ඉලිප්සවල චලනය නො වෙයි. භෞතික විද්‍යාව මෙන් ම ඉතිහාසය ද මිනිසුන්ගේ නිර්මාණ වෙයි. ඒ නිර්මාණ ඇතැම් කරුණු සමග සංගත වෙත්දී තවත් කරුණු සමග සංගත නො වෙයි. ඉතිහාසයේ ද භෞතික විද්‍යාවේ ද වෙනත් ක්ෂෙත්‍රයක ද අපට කළහැක්කේ වඩාත්ම සංගත ප්‍රවාද තෝරාගැනීම පමණ ය.

අප පුන පුනා කියා ඇත්තේ ඉතිහාසය එය ලියන කාලයට සාපේක්ෂ බව ය. සිංහල බෞද්ධ රාජ්‍යයේ පැවැත්ම සඳහා මූලික ප්‍රවාද ගොඩනැගී ඇත්තේ හතරවැනි පස්වැනි සියවස්වල ය. ඒ ප්‍රවාද එක රැයකින් ගොඩනැගුණු දෑ නො වෙයි. හතරවැනි සියවසෙහි ලියැවුණු බවට සැලකෙන දීපවංශය හා පස්වැනි සියවසෙහි ලියැවිණි යැයි කියැවෙන මහාවංශය අතර මූලික වෙනසක් දක්නට නොමැති මුත් විස්තරවලට යෑමේ දීම අවධාරණයෙහි දී, විශාල වෙනසක් දැකිය හැකි ය.

මේ වෙනස ඉතිහාසය පිළිබඳ ප්‍රවාදවල වර්ධනය නිසා ඇති වූවකි. දීපවංශය හා මහාවංශය අධ්‍යයනය කිරීමෙන් පමණක් වුවත් ඒ සියවසක පමණ කාලයෙහි සංකල්පීය වශයෙන් ඇති වී තිබෙන වර්ධනය දැකගත හැකි ය. ඉතිහාසය ඉතිහාසයට සාපේක්ෂ බව මේ සියල්ලෙන් අපට පෙනී යයි. අප ඉතිහාසය හැදෑරිය යුත්තේ එය ඉතිහාසයට ම සාපේක්ෂ බව සිතෙහි දරාගෙන ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva